# ශ්‍රී ලංකාවේ මල් හා විසිතුරු පැල කර්මාන්තය සහ උපනතීන්

උද්‍යානකරණය හා උද්‍යාන කළමනාකරණය ශ්‍රී ලාංකිකයාට නැවුම් හෝ නුහුරු විෂය ක්ෂේත්‍රයක් නොවේ. අතීත රජ සමය දක්වා දිවෙන දිගු ඉතිහාසයක් සහිත ක්ෂේත්‍රයක් ලෙස උද්‍යානකරණය ශ්‍රී ලාංකික සමාජය තුළ මුල් බැස තිබේ. රජ වාසල හා රාජකීය ස්ථානයන් ආශ්‍රිත කොට ගත් රජ සහ රජ පවුලේ ඇත්තන්ගේ විනෝදාශ්වාදය සඳහා නිර්මාණය වූ රාජකීය උද්‍යානයන් මෙන්ම බෞද්ධ ආගමික සිද්ධස්ථාන සහ සඟ සෙනසුන් ආශ්‍රිතව බිහි වූ හෝ නිර්මාණය කරන ලද්දා වූ උද්‍යානයන් හෙවත් උයන් සඳහා අතීතයේ පැවති හා ජීවමාන නිදර්ශන කොතෙකුත් ගෙනහැර දැක්විය හැකිය. තුරුවැල් මෙන්ම ඒවායේ මල් හා එල වලින් සමන්විත වූ උද්‍යාන පමණක් නොව, ජල තටාකාංගන හා ජල මල් සහිත උද්‍යාන නිර්මාණය කිරීමට තරම් වූ අද්විතීය තාක්ෂණ මහිමයකින් හා කලා කෞශල්‍යයකින් යුක්ත වූ ශ්‍රේෂ්ඨ නිර්මාණකරුවන්ගෙන් පෝෂිත ඉතිහාසයක් උද්‍යානකරණය, සම්බන්ධයෙන් මෙරට පවතී. එවැනි විශිෂ්ඨ තාක්ෂණ මහිමයන් හා කුසලතාවයන් උපයෝගී කොට ගෙන නිමවන ලද එකම ජල උද්‍යානයක් සහිත රාජධානිය ලෙස සීගිරිය සඳහන් කළ හැකිය. රජ සමය තුළ උයන් නිර්මානකරණය සඳහා උයන්පල්ලන් ලෙස විශේෂයෙන් පත් කරන ලද, ඒ සඳහා පරිවයක් සහිත නිලධාරීන් පත්කොට සිටීමෙන්ම එවකට පැවති උද්‍යානකරණයේ පරිමිතිය අවබෝධ කොට ගත හැකිය. කෙසේ වෙතත්, අතීතයේ දී හුදෙක් විනෝදාශ්වාදය හෝ සෞන්දර්යාත්මක චින්දනය සඳහා පමණක් හෝ ආධ්‍යාත්මික ගුණ වගාවන් දියුණු කිරීමට අවැසි වටපිටාව නිර්මාණය කිරීම හෝ අරමුණු කොටගත් උද්‍යානකරණය, වර්තමානය වන විට ඊට හාත්පසින්ම වෙනස් වූ වාණිජ ඉලක්කයන් පෙරටු කොට ගත් කර්මාන්තයක් බවට පරිවර්තනය වී තිබේ. තව ද, සෞන්දර්යාත්මක සංකල්පයන් අරමුණු කොට ගත් උද්‍යානකරණය තවමත් ප්‍රායෝගිකව ක්‍රියාත්මක වේ.

වාණිජ අරමුණු සහිත උද්‍යානකරණය (Horticulture) බහුලවම උද්‍යාන බෝග කේන්ද්‍ර කොට ගත් බෝග නිෂ්පාදන පද්ධතියක් (Crop Production System) ලෙස ක්‍රියාත්මක වේ. මෙම උද්‍යාන බෝග වගාව ප්‍රධාන කාණ්ඩ තුනක් යටතේ වර්ග කළ හැකිය. එනම්,

- එළවළු බෝග වගාව
- පළතුරු බෝග වගාව
- මල් හා විසිතුරු පැළ වගාව

එළවළු හා පළතුරු බෝග වගාව ආහාර බෝග (Food Crops) ලෙස ඉතා දිගු ඉතිහාසයක් සහිත වාණිජ බෝග වශයෙන් ශ්‍රී ලංකාවේ කෘෂි ක්ෂේත්‍රයේ වැදගත් ස්ථානයක් හිමි කර ගෙන සිටී. තව ද, අලෙවිය හෝ වාණිජ පරමාර්ථ පදනම් කොට ගනිමින් මල් හෝ විසිතුරු පැල වගාව, බෝග නිෂ්පාදන (Crop Production) ක්‍රමයක් ලෙස සිදු කිරීම ශ්‍රී ලාංකික කෘෂිකර්මාන්තයට නවමු අත්දැකීමකි. එමෙන්ම, මෙම ක්ෂේත්‍රයෙහි විකාශනය හා ප්‍රසාරණය දේශීය කෘෂි ක්ෂේත්‍රය තුළ ඇති කළ හැකි විපර්යාසයන් මහා පරිමාන විය හැකිය. එබැවින්, නව ක්ෂේත්‍රයක් ලෙස මෙහි නිෂ්පාදන හා අලෙවි අංශ පිළිබඳව විමසිලිමත් වීම අතිශය වැදගත්කමක් උසුලනු නොඅනුමානය. ශ්‍රී ලංකාවේ දැනට විවිධ මට්ටම් යටතේ ක්‍රියාත්මක මල් හා විසිතුරු පැල කර්මාන්තයේ ස්වභාවය, එහි හැසිරීම හා අනාගත අපේක්ෂාවන් හා උපනතීන් පිළිබඳ සරල හැඳින්වීමක් සිදුකිරීම මෙම ලිපියේ මූලික අරමුණ ලෙස සඳහන් කළ හැකිය.

"Floriculture" යන ඉංග්‍රීසි වදනට අනුව මෙම කර්මාන්තය හෝ වගාව සම්බන්ධයෙන් මෙය හුදෙක් මල් වගාව පමණක්ම යන අනවබෝධයක් සමාජය තුළ පවතී. සැබැවින්ම, මෙම කර්මාන්තය එහි විවිධ නිෂ්පාදන හා අලෙවි කිරීමට ලක්වන ශාක කොටස් හා ඒවා ඉදිරිපත් කරනු ලබන ආකාරය අනුව ප්‍රධාන කාණ්ඩ කිහිපයක් යටතේ වර්ගීකරණය කළ හැකි වේ.

- කැපූ මල් - Cut Flowers
- කැපූ අතු රිකිලි - Cut Foliage
- කැපූ කොළ - Cut Leaves
- බඳුන්ගත පැල - Potted Plants – Potted Flower Plants Potted Ornamental Plants
- වියළි මල් - Dry Flowers
- ප්‍රචාරක ද්‍රව්‍ය - Propagatory Materials - Rhizomes, Corms, Tubers etc.
  - Tissue Cultured Plants
  - Bedding Plants

දේශීය මල් හා විසිතුරු පැල කර්මාන්තය ප්‍රධාන වශයෙන්ම කැපූ මල්, කැපූ අතු රිකිලි, කැපූ කොළ හා බඳුන්ගත පැල යන නිෂ්පාදන කාණ්ඩ ඉලක්ක කොට ගනිමින් සිදු කරනු ලබන්නකි.

**ඩබ්.එච්.ඒ. ශාන්ත**
පර්යේෂණ නිලධාරී
කෘෂි හා පාරිසරික සම්පත් කළමනාකරණ අංශය
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.

## දේශීය මල් හා විසිතුරු පැල කර්මාන්තයේ ඉතිහාසය හා විකාශනය.

ශත වර්ෂ අඩක් පමණ වූ, සාපේක්ෂව දිගු ඉතිහාසයක් දේශීය මල් හා විසිතුරු පැල කර්මාන්තය (විශේෂයෙන්ම විදේශීය වෙළඳපොළ සමඟ සම්බන්ධ වූ) සතුව පවතී. 1950 දශකය ආරම්භයේ සිට විදේශීය වෙළඳපොළ සමඟ සම්බන්ධතා පැවැත්වීමට දේශීය මල් හා විසිතුරු පැල කර්මාන්තය සමත් වුව ද, එහි මුල් දශක දෙක තුළ දී සැලකිය යුතු වර්ධනයක් ලබා ගනිමින් විදේශීය වෙළඳපොළ තුළ තරඟකාරී මට්ටමකට ළඟාවීමට ශ්‍රී ලංකාව සමත් නොවීය. 1970 දශකය තුළ දී , කැපී පෙනෙන වර්ධනයක් ළඟා කර ගැනීමට දේශීය කර්මාන්තයට හැකි වූ අතර ඒ සඳහා 1973-1978 කාලසීමාව තුළ ලෝක තෙල් වෙළඳපොළ තුළ ඇති වූ අර්බුදය ඍජුවම බලපෑවේය. පැවති තෙල් අර්බුදය, එවකට යුරෝපය තුළ ස්ථායිව පැවති මල් හා විසිතුරු පැල කර්මාන්තය පසුබෑසීමකට ලක් කිරීමට සමත් වූ අතර එම තත්ත්වය ශ්‍රී ලංකාව වැනි ඝර්ම කලාපීය රටවල් බොහොමයකට තම නිෂ්පාදන ධාරිතාව වැඩි කර ගැනීමට, කර්මාන්තයට යොමු වීමට හා නව වෙළඳපොළ වෙත අවතීර්ණ වීමට අවකාශ සලසනු ලැබීය. මෙම හිතකර තත්ත්වයත් සමඟ දේශීය කර්මාන්තය 1970 දශකයේ අවසාන භාගය තුළ හා 1980 දශකය තුළ දී එහි උපරිම වර්ධන සීඝ්‍රතාවයක් ලබාගැනීමට සමත් විය. එහි ප්‍රතිඵලයක් ලෙස 1991 වන විට යුරෝපීය වෙළඳපොළ වෙත විසිතුරු පැල හා මල් සැපයුම් ලැයිස්තුවෙහි (යුරෝපීය නොවන රටවල් අතුරින්) 8 වන ස්ථානය දිනා ගැනීමට හැකිවීම විශාල ජයග්‍රහණයකි.

මෙම තත්ත්වය වර්ධනය කර ගැනීමට හෝ එම තත්ත්වයෙහිම පවත්වා ගැනීමට සමත් නොවීම 1990 දශකය තුළ ශ්‍රී ලාංකීය මල් හා විසිතුරු පැල කර්මාන්තයේ පසුබෑසීම සනිටුහන් කරන්නකි. 1993 වන විට යුරෝපීය වෙළඳපොළ වෙත කැපූ අතු - රිකිලි (Cut Foliage) සැපයීම අතින් 16 වන ස්ථානයේ සිටි ශ්‍රී ලංකාව 1996 වන විට 20 වන ස්ථානය දක්වා පහළ මට්ටමකට බැස තිබුණි. එමෙන්ම, යුරෝපීය වෙළඳපොළ වෙත බඳුන්ගත පැල අපනයනය සම්බන්ධයෙන් ද, මෙවැනිම පහළ බැසීමක් පෙන්නුම් කරනු ලබන අතර 1993 සිට 1996 වන විට 15 වන ස්ථානයේ සිට 23 වන ස්ථානය දක්වා අවවර්ධනයක් ලබා තිබුණි. තව ද, ජපානය වෙත කැපූ මල් සැපයීම සම්බන්ධයෙන් ද මෙම කාලසීමාව තුළ ශ්‍රී ලංකාව පසුබෑසීමකට ලක් විය. මෙම තත්ත්වය තවත් බැරෑරුම් අතට පත්වෙමින් වසර 2001 වන විට ලෝක වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාව කැපූ මල් හා අතුරිකිලි සැපයීම සම්බන්ධයෙන් 39 වන ස්ථානයට බැස තිබූ අතර වර්තමානය වන විට එය 42 වන ස්ථානය තෙක් අවවර්ධනයකට ලක්ව තිබේ.

වාණිජ කර්මාන්තයක් ලෙස මල් හා විසිතුරු පැල වගාව වර්ධනය වූ මුල් දශක දෙකක පමණ කාලය (1950-1980) තුළ වැඩි අවධානය මල් වගාව සඳහා යොමුව පැවතිනි. එයට ප්‍රධාන හේතුව වූයේ ශ්‍රී ලංකාව විසින් විදේශ වෙළඳපොළ වෙත නිෂ්පාදන ඉදිරිපත් කිරීමේ දි කැපූ මල් සඳහා විශේෂ ප්‍රමුඛත්වයක් ලබාදීමයි. ශ්‍රී ලංකාවේ බහුල ලෙස කැපූ මල් වෙනුවට වගා කරනු ලැබ ඇත්තේ ඇන්තූරියම්, කානේෂන් සහ ඕකිඩ් යන වර්ගයන් ය. විනෝදාංශයක් ලෙස මුල් අවදියේ දී සිදුකරන ලද ඕකිඩ් වගාව පසුව වඩාත් මැනවින් සංවිධානගත කර්මාන්තයක් ලෙසට වර්ධනය වීම සිදු වූ අතර ඒ හරහා ලංකා ඕකිඩ් කවය (Orchid Circle of Ceylon) බිහි විය. වඩාත් ඉදිරි පියවරක් ලෙස Exotics and Orchids Co-operative Society (Lakmalsala) බිහිවීම ඕකිඩ්, ඇන්තූරියම් වැනි කැපූ මල් සහ වෙනත් මල් හා විසිතුරු පැල වගාව වෙත ක්ෂේත්‍රය සම්බන්ධයෙන් උනන්දු වූ බොහෝ පිරිසක් බිහිවීම සඳහා අනුබලයක් විය.

1970 දශකය තුළ මල් හා විසිතුරු පැල කර්මාන්තය දේශීය මෙන්ම විදේශීය වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් වර්ධනය වූ අතර දේශීය වෙළඳපොළ තුළ මල් ශාලා සහ සංචාරක කර්මාන්තය ආශ්‍රිත හෝටල් හා උත්සව ශාලා ප්‍රධාන ස්ථානයක් හිමි කර ගෙන තිබුණි. විදේශීය වෙළඳපොළ තුළ කැපූ මල් සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමුව පැවති අතර ඕකිඩ්, ඇන්තූරියම්, කානේෂන් ආදී මල් වර්ග කිහිපයකට පමණක් ප්‍රමුඛත්වය හිමිව පැවතීම සඳහන් කළ යුතු වූවකි. මෙම කාලසීමාව තුළ දී පවා මල් හා විසිතුරු පැල කර්මාන්තය සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය ඉතා මැනවින් හඳුනාගෙන තිබූ අතර ඒ සඳහා රාජ්‍ය ආයතන රාශියක ක්‍රියාකාරී මැදිහත්වීම පැහැදිලිව නිරීක්ෂණය කළ හැකි විය. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය, අපනයන ප්‍රවර්ධන ලේකම් කාර්යාලය හා මහජන බැංකුව වැනි ප්‍රමුඛ රාජ්‍ය ආයතනයන් හි දායකත්වය කර්මාන්තයේ උන්නතිය සඳහා නොමඳව ලබා දී තිබුණි. එවකට පැවති ආර්ථික ක්‍රමය තුළ සමුපකාර ක්‍රමය හරහා (Co-operative Approach) මෙම කර්මාන්තය ඉහළ නැංවීමට වැඩි අවධානයක් යොමු විය.

ශ්‍රී ලංකා සමුපකාර වෙළඳ සම්මේලනය (Sri Lanka Co-operative Marketing Federation) මල් හා විසිතුරු පැල අලෙවිය හා සම්බන්ධ වීම, ලක්මල්සල (Exotics and Orchids Co-operative Society) මල් අපනයනය සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හා මල් වගාකරුවන් ඒකරාශී කිරීම මෙන්ම ඔවුන්ට අවශ්‍ය පුහුණු හා යෙදවුම් අවශ්‍යතා සැපිරීම, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ රාජකීය උද්‍යානය මඟින් පුහුණු පාඨමාලා සංවිධානය, රෝපණ ද්‍රව්‍ය ලබාදීම හා වෙනත් උපදේශන සේවා සැපයීම මෙම කාලසීමාව තුළ කර්මාන්තයේ වර්ධනය සඳහා ක්‍රියාත්මක වූ සුභවාදී පියවරයන් ලෙස සඳහන් කළ හැකිය. එමෙන්ම, සමුපකාර කළමනාකරණ සේවා මධ්‍යස්ථානය (Co-operative Management Services Centre) විසින් මල් හා විසිතුරු පැල කර්මාන්ත ක්ෂේත්‍රයේ සමාජ - ආර්ථික පර්යේෂණ සිදු කිරීම හා අවශ්‍ය ප්‍රතිපත්ති නිර්දේශ ලබාදීම, අපනයන ප්‍රවර්ධන ලේකම් කාර්යාලය (Export Promotion Secretariat) මඟින් ජාත්‍යාන්තර වෙළඳ මධ්‍යස්ථානය (International Trade Centre) සමඟ ඒකාබද්ධව විදේශීය වෙළඳපොළ පිළිබඳ පර්යේෂණ සිදු කිරීම සහ මෙම බොහෝ කටයුතු සඳහා මහජන

බැංකුවේ මූල්‍ය සහයෝගය හා දායකත්වය ලබාදීම ද මෙම කාලසීමාව තුළ සිදු වූ ක්‍රියාකාරකම් අතුරෙන් සමහරකි.

මෙම කාල පරිච්ඡේදය තුළ සිදු කරන ලද පර්යේෂණයන් හි ප්‍රතිඵල ලෙස කර්මාන්තයේ උන්නතිය සඳහා ක්‍රියාත්මක කළ යුතු උපාය මාර්ග රාශියක් හඳුනාගෙන තිබූ අතර ඒවායෙන් බොහොමයක්ම ක්‍රියාවට නැඟුණි. එවැනි උපාය මාර්ග ලෙස,

(i) මල් හා විසිතුරු පැල වගාව ගෘහාශ්‍රිත කර්මාන්තයක් ලෙස සංවර්ධනය කිරීම (Cut Flower as a Cottage Industry)

(ii) කර්මාන්තයේ සමුපකාරමය ක්‍රියාකාරකම් හි සංවර්ධනය (Development of Co-operative Activities) : මෙහි දී වගාකරුවන් සංවිධානගත කිරීම හා එම සංවිධාන හරහා යෙදවුම් මෙන්ම තාක්ෂණික සේවාවන් සැපයීම හා නිෂ්පාදන අලෙවිය අපේක්ෂා කොට තිබුණි.

(iii) ව්‍යාප්ති සේවය ශක්තිමත් කිරීම (මෙහි දී රාජකීය උද්භිද උද්‍යානය හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත වැඩි කාර්යභාරයක් පැවරී තිබුණි.)

(iv) සමුපකාර ගිවිසුම්ගත වගා ක්‍රමය ප්‍රචලිත කිරීම (Co-operative Contract Farming)

(v) මල් හා විසිතුරු පැල එකතු කිරීම (දේශීය හා විදේශීය වෙළඳපොළ වෙනුවෙන්) සඳහා කාර්යක්ෂම ප්‍රවාහන සේවයක් ඇති කිරීම (Transport for Collection of Cut Flowers and Foliage)

(vi) නව ක්ලෝන (Clones) නිපදවීම හා පවතින ප්‍රභේදයන් හි ගුණය වඩාත් ඉක්මණින් සිදුකිරීම සඳහා "Meristematic Production" හරහා පැල ලබා ගැනීමට රාජකීය උද්භිද උද්‍යානයේ පර්යේෂණ නිලධාරීන් පුහුණු කිරීම හා අදාළ රාජ්‍ය ආයතනයන් හි ක්‍රියාකාරිත්වය සක්‍රිය කිරීම වැනි පියවරයන් ක්‍රියාත්මක විය. තව ද, දිවයින පුරා විසිරී සිටි වාණිජ මට්ටමේ ඕකිඩ් හා ඇන්තූරියම් වගාකරුවන් (Growers) සහ පැල නිපදවන්නන් (Seedling Producers) පිළිබඳව සමීක්ෂණය කිරීම හා ඔවුන් ඒකරාශී කිරීම තුල පැල නිපදවීම වේගවත් කිරීම සඳහා ව්‍යාපෘති හඳුන්වාදීම, එම කාලවකවානුව තුළ දී කර්මාන්තයේ දියුණුව සඳහා තැබූ වැදගත් ඉදිරි පියවරයන් ලෙස සටහන් කළ හැකිය.

1978 පසුව සිදු වූ ආර්ථික ලිහිල්කරණය හා නිර්බාධ වෙළඳක්‍රමය නිසා වැඩි ව්‍යවසායකයින් පිරිසකට විදේශීය වෙළඳපොළ සමඟ සම්බන්ධවීම සඳහා අවකාශ සැළසුනි. 1980 දශකය තුළ දී විසිතුරු පැල, කැපූ කොළ හා කැපූ අතුරිකිළි (Live Plants and Cut Foliage) සැපයීම අතින් ප්‍රධාන විදේශීය වෙළඳපොළ වෙත සැලකිය යුතු මට්ටමකින් අවතීර්ණ වීමට හැකිවීම හා 1991 පමණ වන විට යුරෝපීය වෙළඳපොළ වෙත විසිතුරු පැල හා කැපූ කොළ හා අතු - රිකිලි සැපයීම අතින් ප්‍රමුඛ ස්ථානයක් ලබා ගැනීමට හැකිවීම කර්මාන්තයේ විශාල වර්ධනයකි.

1983-1993 කාල වකවානුව තුළ දී කෘෂිකාර්මික ආර්ථික පද්ධතිය තුළ වේගවත්ම වර්ධන වේගයක් සහිත උප අංශය ලෙස ක්‍රියාත්මක වූයේ උද්‍යාන බෝග අංශයයි. මෙම උද්‍යාන බෝග උප අංශය තුළ මල් හා විසිතුරු පැල වගාව විසින් සැලකිය යුතු දායකත්වයක් සපයා දෙනු ලැබීය. මෙම කාලසීමාව තුළ දී විසිතුරු පැල, කැපූ කොළ හා අතුරිකිලි මෙන්ම රෝපන ද්‍රව්‍ය අපනයනය විසින් කැපූ මල් අපනයනය අභිබවා යාමක් නිරීක්ෂණය කළ හැකිවේ. විශේෂයෙන්ම, රෝපන ද්‍රව්‍ය ලෙස බල්බ, කෝම හා ආකන්ධ අපනයනයෙහි නියත වාර්ෂික වැඩිවීමක් මෙම කාල වකවානුව පුරාම පෙන්නුම් කරයි. කැපූ මල් අපනයනයෙහි වටිනාකම එකතැන රැඳී තිබෙන ස්වභාවයක් පෙන්නුම් කරමින් එහි සාපේක්ෂ වර්ධනයේ මන්දගාමීත්වය විදහා පෑම ද මෙම කාල පරිච්ඡේදය තුළ නිරීක්ෂණය කළ හැකිය.

ජාතික විද්‍යා ප්‍රතිපත්ති වාර්තාව (1984) මඟින් ස්ථාපනය කිරීම සඳහා නිර්දේශ කරන ලද ඇතැම් ආයතන හරහා මෙම කර්මාන්තයේ සංවර්ධනයට යහපත් වූ පියවරයන් කෙටුම්පත් කොට තිබුණි. එම ප්‍රතිපත්ති වාර්තාව මඟින් ජාතික මල් හා විසිතුරු පැල කර්මාන්තය ආශ්‍රිත මහ ලේකම් කාර්යාලයක් (Floriculture Secretariat) බිහි කිරීම හරහා කර්මාන්තය ආශ්‍රිත සමස්ථ කාර්යාවලීන් සඳහා වග කියනු ලබන නිශ්චිත ආයතනයක් ස්ථාපිත කිරීමට පියවර ගෙන පැවතිය ද, එවැනි ආයතනයක් තවමත් බිහි වී නොමැත. එමෙන්ම, ජෛව තාක්ෂණ විද්‍යාගාරයක් (Biotechnology Laboratory) බිහි කිරීම හරහා මෙම කර්මාන්තය ඇතුළු සෙසු බෝග වගා කටයුතු සංවර්ධනය කිරීමට යෝජනා වී පැවතිය ද, එවැනි කටයුත්තක් යථාර්ථයක් බවට පත් කර ගැනීමට මේ වන තෙක් නොහැකි වී තිබේ.

1990 දශකය තුළ දී මල් හා විසිතුරු පැල කර්මාන්තයේ සාපේක්ෂ පසුබෑමක් විදේශීය වෙළඳපොළ තුල නිරීක්ෂණය කළ හැකිය. විදේශීය වෙළඳපොළ වෙත ඉදිරිපත් කරනු ලැබූ හෝ අපනයනය කරන ලද නිෂ්පාදන ප්‍රමාණයන් හි සහ ඒවායේ වටිනාකම්වල අඛණ්ඩ වර්ධනයක් දක්නට ලැබුණ ද, වෙනත් රටවල් සමඟ තරඟකාරී ලෙස නිෂ්පාදන අපනයනය වැඩි නොවීම විදේශීය වෙළඳපොළ තුල ශ්‍රී ලංකාව සතුව පැවති ස්ථානය ඉන් ගිලිහී යාමට හේතුවී තිබේ. මේ වන විට ශ්‍රී ලංකාව විදේශීය වෙළඳපොළ තුළ අපනයනය අතින් 42 වන ස්ථානයේ පසු වේ.

පසුගිය වසර 30කට අධික කාලසීමාව තුළ බිහි වූ කෘෂිකාර්මික ප්‍රතිපත්ති තුළ මල් හා විසිතුරු පැල කර්මාන්තය සඳහා සැලකිය යුතු ස්ථානයක් ලැබී තිබුණි. 1994 හා 2003 කෘෂිකර්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් ද මල් හා විසිතුරු පැල කර්මාන්තය සංවර්ධනය කිරීමේ වැදගත්කම හා ඒ සඳහා ගතයුතු ප්‍රතිපත්තිමය තීරණ මෙන්ම ක්‍රියාකාරකම් පැහැදිලිව

දක්වනු ලබයි. 1989 දී ආරම්භ කරන ලද පළමු බහුවාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතිය (First Perennial Crop Development Project) මගින් හා 1998 දී ආරම්භ කරන ලද දෙවන බහුවාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතිය (Second Perennial Crop Development Project) මගින් මල් හා විසිතුරු පැල කර්මාන්තය සඳහා වගාකරුවන් වෙත මූල්‍යමය දායකත්වය ලබාදෙන ලදී. විශේෂයෙන්ම, දෙවන බහුවාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ "අරුණ" ණය යෝජනා ක්‍රමය හරහා වගාකරුවන් වැඩි පිරිසකට අවශ්‍ය මූල්‍ය සහයෝගය ලබාදීමට කටයුතු කොට තිබේ. වර්තමානයේ දී, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන මෙන්ම ආයතන රාශියක් මෙම කර්මාන්තයේ සංවර්ධනය සඳහා කටයුතු කිරීමට යොමුව සිටී. කුඩා හා මධ්‍ය පරිමාන කර්මාන්තකරුවන් ලෙස ග්‍රාමීය හා අර්ධ නාගරික ප්‍රදේශයන් හි වගාකරුවන් ගේ ගෘහස්ථ ආදායම වැඩිකිරීම මෙන්ම රැකියා උත්පාදනය අරමුණු කොට ගනිමින් මල් හා විසිතුරු පැල කර්මාන්තය ව්‍යාප්ත කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. සමෘද්ධි සංවර්ධන වැඩසටහන, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, කුඩා හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය වැනි රාජ්‍ය ආයතන ග්‍රාමීය ප්‍රදේශ තුළ මෙම කර්මාන්තය ප්‍රචලිත කිරීමේ හා ස්ථාපනය කිරීමේ කාර්යාවලීන් හි නිරතව සිටියි.

1990 දශකයේ දී, ස්ථාපිත කරන ලද පැලෑටි නිරෝධායන මධ්‍යස්ථානය නිසා විසිතුරු පැල හා මල් කර්මාන්තයේ ආනයන හා අපනයන වෙළඳ කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීමට හැකි වී තිබේ.

## දේශීය මල් හා විසිතුරු පැල කර්මාන්තයේ විදේශීය වෙළඳපොළ

ලිපිය ආරම්භයේ දී සඳහන් කළ පරිදි මෙම කර්මාන්තය විදේශීය වෙළඳපොළ සමඟ සම්බන්ධවීම 1950 දශකය තුළ සිදුවී ඇති අතර 1970 දශකය තුළ වඩාත් ශක්තිමත් වී තිබේ. ආරම්භක අවධියේ සිට 1980 දශකයේ පූර්ව අවධිය වන තෙක් විදේශීය වෙළඳපොළ වෙත කැපූ මල් සැපයීම සඳහා වැඩි ප්‍රමුඛතාවයක් ලබා දී තිබූ අතර ඕකිඩ්, ඇන්තූරියම් හා කානේෂන් ප්‍රධාන කැපූ මල් වර්ග ලෙස විදේශීය වෙළඳපොළ වෙත ඉදිරිපත් කෙරුණි. එම අවධියේ දී කැපූ මල් සැපයීම සම්බන්ධයෙන් විදේශීය වෙළඳපොළ තුළ කැපී පෙනෙන අපනයනකරුවෙකු බවට පත්වීමට ශ්‍රී ලංකාව සමත් නොවීම පැහැදිලිව නිරීක්ෂණය කළ හැකි වේ. විදේශීය වෙළඳපොළ සමඟ සම්බන්ධ වූ අඛණ්ඩ මල් හා පැල අපනයනය කිරීම සිදුකරනු ලැබූ ව්‍යාපාරිකයන් හා ව්‍යවසායකයින් (අපනයනකරුවන්) නොමැතිවීම ද මෙම තත්ත්වයට බලපා තිබේ. 1978 පමණ වන විට මල් හා විසිතුරු පැල අපනයනයෙන් 85-90% පමණ ප්‍රතිශතයක් සඳහා දායකත්වය සපයනු ලැබුවේ Exotics and Orchids Co-operative Society ය. අඛණ්ඩ හා විශ්වාසවන්ත විදේශ ඇණවුම් නොලැබීම බොහෝ මල් හා පැල අපනයනකරුවන් මන්දෝත්සාහී වීමට බලපෑ ප්‍රධාන හේතුවකි.

1977 පමණ වන විට, සමස්ථ කැපූ මල් අපනයනයෙන් 35% ක පමණ ප්‍රතිශතයක් ඇන්තූරියම් මගින් හිමි කර ගෙන තිබූ අතර ඉතිරි ප්‍රමාණය ඕකිඩ්, කානේෂන් වැනි වෙනත් මල් විශේෂ වෙතින් පූර්ණය විය. මෙම කාලවකවානුව තුළ නිෂ්පාදන ඉදිරිපත් කිරීම බටහිර යුරෝපීය වෙළඳපොළ වෙත පමණක් සීමාවීම විදේශීය වෙළඳපොළ ජය ගැනීම සඳහා පැවති තවත් බාධකයක් විය.

1960-1970 දශකය තුළ දී ලෝක මල් හා විසිතුරු පැල කර්මාන්තයේ පාලනය නෙදර්ලන්තය, ප්‍රංශය හා ඉතාලිය යන රටවල් ත්‍රිත්වය විසින් ප්‍රධාන වශයෙන්ම දැරූ අතර ඊශ්‍රායලය, ස්පාඤ්ඤය හා දකුණු අප්‍රිකාව සෙසු ප්‍රධාන රටවල් ලෙස දැක්විය හැකිය. ජර්මන් මහජන සමූහාණ්ඩුව ප්‍රධාන කැපූ මල් හා විසිතුරු පැල ගැණුම්කරුවා විය. 1977 වර්ෂයේ දී ජර්මනිය විසින් ආනයනය කරන ලද

**වගුව 1**

**විසිතුරු පැල සහ මුල් සහිත මෙන්ම රහිත අතු - රිකිලි අපනයනය**

| වර්ෂය | 1981 | | 1982 | | 1983 | | 1984 | |
|---|---|---|---|---|---|---|---|---|
| රට | ප්‍රමාණය (ටොන්) | වටිනාකම ('000) | ප්‍රමාණය (ටොන්) | වටිනාකම ('000) | ප්‍රමාණය (ටොන්) | වටිනාකම ('000) | ප්‍රමාණය (ටොන්) | වටිනාකම ('000) |
| ජර්මන් මහජන සමූහාණ්ඩුව | - | - | - | - | 9 | 188 (ඩො.මා) | 11 | 282 (ඩො.මා) |
| එක්සත් රාජධානිය | - | - | 0.26 | 2(ස්.ප.) | 2.26 | 12(ස්.ප.) | 04 | 30(ස්.ප.) |
| නෙදර්ලන්තය | 10 | 110(ගි.) | 14 | 167(ගි.) | 39 | 371(ගි.) | 66 | 779(ගි.) |
| ස්විට්සර්ලන්තය | 1.3 | 18 (ස්.ෆ්‍රෑ ) | 4.2 | 83 (ස්.ෆ්‍රෑ ) | 6.8 | 122 (ස්.ෆ්‍රෑ ) | 11.8 | 212 (ස්.ෆ්‍රෑ ) |

මූලාශ්‍රය - International Trade Centre, Geneva, 1987.

ඩො.මා. - ඩොයිෂ් මාක් ගි. - ගිල්ඩර්

ස්.ප. - ස්ටර්ලින් පවුම් ස්.ෆ්‍රෑ. - ස්විට්සර්ලන්ත ෆ්‍රෑන්ක්

සමස්ථ කැපූ මල් ප්‍රමාණයෙහි ශ්‍රී ලාංකීය දායකත්වය 0.0007% වැනි ඉතාමත් සුළු ප්‍රමාණයක් වූ අතර එමගින්, එම අවධියේ පැවති විදේශීය වෙළඳපොළ සඳහා වූ දේශීය දායකත්වය අවබෝධ කර ගත හැකි වේ. 1970 දශකයේ අගභාගය වන විට හා 1980 දශකයේ පළමු අර්ධය පුරාම ද ප්‍රධාන කැපූ මල් ආනයනකරු ලෙස ජර්මන් මහජන සමූහාණ්ඩුව කැපී පෙණුනි.

1980 දශකය මුල් භාගය අවසන් වන විට, කැපූ මල් අභිබවමින් විසිතුරු පැල හා කැපූ අතු-රිකිලි අපනයනය හරහා ප්‍රධාන විදේශීය වෙළඳපොළ කරා ළඟාවීමට ශ්‍රී ලංකාවට හැකියාව ලැබුණි. වගු අංක 1 මගින් මෙම වර්ධනය සිදුවී ඇති ආකාරය පැහැදිලිව දැක් වේ. යුරෝපීය වෙළඳපොළ තුළ ප්‍රධාන ආනයන රටවල් වෙත සැලකිය යුතු මට්ටමින් පැල හා කැපූ අතු - රිකිලි අපනයනය වර්ධනය වී ඇති ආකාරය එම වගුව මගින් නිරූපනය කරනු ලබයි. බටහිර වෙළඳපොළ තුළ ප්‍රංශය, කැනඩාව හා ඇමරිකා එක්සත් ජනපදය වැනි රටවල් සමඟ කර්මාන්තය සම්බන්ධයෙන් ශක්තිමත් සබඳතා පවත්වා ගැනීමට නොහැකිවීම කර්මාන්තයේ වර්ධන වේගය මන්දගාමී වීමට හේතු වී තිබේ. එමෙන්ම, විදේශීය වෙළඳපොළ වෙත ප්‍රවිශ්ඨ වූ සංවර්ධනය වෙමින් පවතින රටවල් සමඟ තරඟකාරී ලෙස ඉදිරියට ගමන් කිරීමට අවශ්‍ය හැකියාව නොමැතිවීම ද දේශීය කර්මාන්තයට බලපෑ තවත් සාධකයකි.

මෙම අවධිය වන විට කෙන්යාව, සිම්බාබ්වේ, මුරුසි දිවයින, ඉතියෝපියාව, නයිජීරියාව, ටියුනීසියාව, ටැන්සානියාව වැනි අප්‍රිකානු රටවල් ද, කොලොම්බියාව, ඉක්වදෝරය, කියුබාව, ජැමෙයිකාව, පීරු, චිලී, බ්‍රසීලය වැනි ලතින් ඇමරිකානු රටවල් ද, සිංගප්පූරුව, තායිලන්තය, මැලේසියාව වැනි අග්නිදිග ආසියානු රටවල් ද, සවුදි අරාබිය, ඊජිප්තුව වැනි මැදපෙරදිග රටවල් ද, කැපූ මල් හා විසිතුරු පැල කර්මාන්ත අංශයෙන් විශාල දියුණුවක් ළඟා කර ගැනීමට සමත් විය. තරඟකාරී ලෙස විදේශීය වෙළඳපොළ වෙත තම නිෂ්පාදන ඉදිරිපත් කිරීම හරහා තම වාණිජ ස්ථාවරත්වය පවත්වා ගැනීමට හා ආර්ථික සංවර්ධනය වේගවත් කිරීමට මෙමගින් හැකියාව ලබා ගැණුනි.

කෙසේ වෙතත්, 1991 වන විට යුරෝපීය වෙළඳපොළ වෙත විසිතුරු පැල හා අතු - රිකිලි සැපයීමේ අපනයනකරුවන් අතර 9 වන ස්ථානය ලබා ගැනීමට ශ්‍රී ලංකාව සමත් විය. එම ස්ථාවරත්වය දිගින් දිගටම රැක ගැනීමට නොහැකිවීම නිසා විදේශීය වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාවේ ස්ථානය අවගමනයකට ලක් ව තිබේ. තව ද, කර්මාන්තය හරහා ගලා එන විදේශ විනිමය ප්‍රමාණය පසුගිය දශකයකට වැඩි කාලයක සිට සැලකිය යුතු ලෙස වැඩි වී තිබේ. වගු අංක 2 මගින් පසුගිය වසර කිහිපය තුළ මල්, විසිතුරු පැල හා අතු - රිකිලි මගින් උපයා ගනු ලැබූ විදේශ විනිමය ප්‍රමාණය පෙන්නුම් කරයි.

**වගුව 2**

**කැපූ මල්, විසිතුරු පැල, අතු - රිකිලි හා රෝපන ද්‍රව්‍ය අපනයන ආදායම**

| වර්ෂය | අපනයන ආදායම රු. මිලියන |
|---|---|
| 1993 | 287.4 |
| 1994 | 406.83 |
| 1995 | 430.1 |
| 1996 | 454.24 |
| 1997 | 484.39 |
| 1998 | 484.26 |
| 1999 | 571.67 |
| 2000 | 625.05 |
| 2001 | 723.1 |
| 2002 | 776.0 |
| 2003 | 924.85 |
| 2004 | 915 |

**මූලාශ්‍රය - ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

*මෙම සලකන ලද කාලසීමාව තුළ දී (1993-2004 දක්වා) අපනයන ආදායම 218% ක ප්‍රතිශතයකින් වැඩි වී ත්බේ.*

මෙම කාලසීමාව තුළ අපනයනය කරන ලද මල් හා විසිතුරු පැල කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන වර්ගයන් සැලකීමේ දී, ඇතැම් නිෂ්පාදන කාණ්ඩයන් හි අපනයන ආදායම් ඉහළ ගොස් ඇති බවත්, ඇතැම් නිෂ්පාදන වර්ගයන් හරහා උපයන ලද විදේශ විනිමය ප්‍රමාණය සාපේක්ෂව අඩුවී ඇති බවත් පෙනී යයි. වගු අංක 2 මගින් කර්මාන්තය ආශ්‍රිත විවිධ නිෂ්පාදනයන් හි අපනයන ආදායම වෙනස් වී ඇති ආකාරය පිළිබිඹු කෙරේ.

වගු අංක 3 මගින් දක්වා ඇති දත්ත හා අගයන් අනුව ජීවී පැල සහ කැපූ කොළ හා අතු - රිකිලි අපනයන ආදායමෙහි ක්‍රමික වර්ධනයක් නිරීක්ෂණය කළ හැකි වේ. එමෙන්ම, කැපූ මල් අපනයනය හරහා ගලා එන විදේශ විනිමය ප්‍රමාණය ද වාර්ෂිකව ඉහළ ගොස් තිබේ. කෙසේ වෙතත්, රෝපන ද්‍රව්‍ය යටතේ අපනයනය කරනු ලබන බල්බ (Bulbs), කෝම (Corms) හා ආකන්ධ (Tubers) යන වර්ගයන් හි අපනයන ආදායම ඉතාමත් සීඝ්‍රයෙන් අඩු වී ඇති අතර 2003 වර්ෂයේ අපනයන ආදායම 1993 වර්ෂයේ ආදායමෙන් දහයෙන් එකකට ආසන්න ඉතාමත් අඩු ප්‍රතිශතයකි. වසර 2000 න් පසු, කැපූ මල් අපනයන ආදායම 400% කින් පමණ ඉහළ ගොස් (2003 වසර හා 1999 වසර සැසඳීමේ දී) තිබේ.

ආරම්භයේ දී යුරෝපීය වෙළඳපොළට පමණක් සීමාවී තිබූ දේශීය මල් හා විසිතුරු පැල අපනයනය මැදපෙරදිග හා ජපානය වැනි නැගෙනහිර ආසියානු රටවල් හා හොංකොං වැනි අග්නිදිග ආසියානු රටවල්

වගුව 3 -

**නිෂ්පාදන වර්ග අනුව අපනයන ආදායම (රු. මිලියන)**

| වර්ෂය \ නිෂ්පාදන වර්ගය | රෝපන ද්‍රව්‍ය බල්බ. කෝම, ආකන්ධ | ජීවී පැල (live plant) | කැපූ මල් (cut flower) | කැපූ කොල හා අතු - රිකිලි (cut foliage) |
|---|---|---|---|---|
| 1993 | 21.6 | 120.3 | 34.5 | 111.0 |
| 1994 | 10.03 | 162.4 | 45.3 | 189.1 |
| 1995 | 6.1 | 179.0 | 54.8 | 190.2 |
| 1996 | 11.4 | 194.01 | 32.24 | 216.59 |
| 1997 | 8.3 | 201.37 | 45.28 | 229.44 |
| 1998 | 0.69 | 219.7 | 47.07 | 216.8 |
| 1999 | 0.13 | 284.4 | 67.68 | 219.4 |
| 2000 | 0.09 | 249.1 | 142.32 | 233.18 |
| 2001 | 1.3 | 293.17 | 146.26 | 282.37 |
| 2002 | 0.1 | 302.5 | 150.36 | 323.21 |
| 2003 | 0.06 | 318.5 | 264.48 | 341.76 |

මූලාශ්‍රය - අපනයන සංවර්ධන මණ්ඩලය

වෙත ද, එයට අමතරව ඕස්ට්‍රේලියාව හා ඇමරිකා එක්සත් ජනපදය වෙත ද, ප්‍රසාරණය වී තිබේ. විශේෂයෙන්ම, ජපානය ශ්‍රී ලාංකික කාන්තේෂන් මල් සඳහා නව වෙළඳපොළක් ලෙස පැහැදිලි වර්ධනයක් පෙන්නුම් කරයි.

යුරෝපීය රටවල්, ශ්‍රී ලංකාවේ මල් හා විසිතුරු පැල ආශ්‍රිත නිෂ්පාදන සඳහා ප්‍රධාන විදේශීය වෙළඳපොළ ලෙස තවමත් වැඩි කාර්යභාරයක් ඉටු කරයි. වසර 2001 වන විට, ශ්‍රී ලංකාව සඳහා වූ ප්‍රධාන විදේශ වෙළඳ මධ්‍යස්ථාන වගු අංක 4 මඟින් පෙන්නුම් කරයි.

වගුව 4

**ශ්‍රී ලංකාවේ මල් හා විසිතුරු පැල ආශ්‍රිත නිෂ්පාදන සඳහා ප්‍රධාන විදේශීය වෙළඳ මධ්‍යස්ථාන**

| ස්ථානය | රට |
|---|---|
| 1 | නෙදර්ලන්තය |
| 2 | ජපානය |
| 3 | ජර්මනිය |
| 4 | එක්සත් රාජධානිය |
| 5 | ඉතාලිය |
| 6 | ප්‍රංශය |
| 7 | එක්සත් ආරබි එමීර් රාජ්‍යය |
| 8 | කුවේට් |
| 9 | ඇමරිකා එක්සත් ජනපදය |
| 10 | සවුදි අරාබිය |

මූලාශ්‍රය - අපනයන සංවර්ධන මණ්ඩලය

ලෝක වෙළඳපොළ තුළ මල් හා විසිතුරු පැල කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන සඳහා වන ඉල්ලුම දිනෙන් දින වැඩි වෙමින් පවතී. මෙම කර්මාන්තයේ දියුණුව සඳහා ආයෝජන දිරිගැන්වීම හා ප්‍රතිපත්තිමය නිර්දේශ ක්‍රියාත්මක කිරීම, පර්යේෂණ හා සංවර්ධන

වගුව 5

**මල් හා විසිතුරු පැල ආශ්‍රිත නිෂ්පාදන අපනයනකරුවන්ගේ වර්ධනය**

| වර්ෂය | අපනයනකරුවන්ගේ දායකත්වය |
|---|---|
| 1992 | 116 |
| 1995 | 118 |
| 1998 | 109 |
| 2001 | 140 |

මූලාශ්‍රය - අපනයන සංවර්ධන මණ්ඩලය
ශ්‍රී ලංකා රේගුව

වැඩසටහන් වැඩිදියුණු කිරීම, වෙළඳපොළ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම වැනි ධනාත්මක පියවරයන් බොහෝ රටවල් විසින් අනුගමනය කරනු ලබන බවද මෙහි සඳහන් කළ යුතුය. එබැවින්, වඩාත් උසස් නිෂ්පාදන තරඟකාරී මිලට සැපයීම, සෑම නිෂ්පාදන රටකටම අභියෝගයක් ව පවතී. විදේශීය වෙළඳපොළ තුළ රැඳී සිටීම සඳහා මෙම පියවරයන් වේගවත් කිරීම අත්‍යාවශ්‍යය.

මල් හා විසිතුරු පැල කර්මාන්තයේ වර්ධනය සඳහා මල් අපනයනකරුවන්ගේ දායකත්වය ඉතාමත් වැදගත් වේ. මුල් අවධියේ දී පුද්ගලික ව්‍යවසායකයින්ගේ මැදිහත්වීම මල් අපනයනය තුළ ඉතාමත් සීමිත වූ අතර 1978 දී හඳුන්වා දුන් විවෘත ආර්ථික ප්‍රතිපත්තිය, සමාගම් හා පුද්ගලයින් වැඩි පිරිසක් ක්ෂේත්‍රයට එකතු වීමට බලපෑ එක් හේතුවකි. පසුගිය දශකයක පමණ කාල සීමාව තුළ මල් හා විසිතුරු පැල ආශ්‍රිත නිෂ්පාදන අපනයනයට සම්බන්ධ වූ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් හා පුද්ගලයින් සංඛ්‍යාව වගු අංක 5 හි දක්වා තිබේ. සෑම මල් හා විසිතුරු පැල ආශ්‍රිත නිෂ්පාදන අපනයනකරුවෙක් මෙන්ම වගාකරුවෙකු වීම විශේෂ කරුණක් ලෙස සඳහන් කළ යුතුය.

දශකයක කාල සීමාවක් තුළ දී සැලකිය යුතු අපනයනකරුවන් පිරිසක් අලුතින් ක්ෂේත්‍රයට එකතුවී ඇති බව ඉහත වගුව ආශ්‍රයෙන් පැහැදිලි වේ. එමෙන්ම විවිධ හේතුන් නිසා නිෂ්පාදන අපනයන ක්ෂේත්‍රය වෙතින් ඉවත් වූ ව්‍යවසායකයින් හා සමාගම් ද මෙම කාලසීමාව තුළ දී දැකිය හැකිය.

මල් හා විසිතුරු පැල ආශ්‍රිත නිෂ්පාදන අපනයනකරුවන්ගෙන් සැදුම්ලත් Sri Lanka Floriculture Produce Exporters' Association අද වන විට ශක්තිමත් සංවිධානයක් බවට පත්ව ඇති අතර අපනයන ක්ෂේත්‍රය සම්බන්ධ ගැටළු පිළිබඳව අදාල බලධාරීන් දැනුවත් කිරීම හා අවශ්‍ය විසඳුම් සඳහා ආයතන පෙළඹවීම වැනි කටයුතු සිදු කරයි. එමෙන්ම, කර්මාන්තය ආශ්‍රිත පර්යේෂණ හා සමීක්ෂණ සඳහා මූල්‍ය ප්‍රතිපාදන සැපයීම සහ අවශ්‍ය සහයෝගය ලබාදීම වැනි සංවර්ධන කාර්යයන් සඳහා ද තම දායකත්වය සපයයි.

2001 වන විට ශ්‍රී ලාංකික මල් හා විසිතුරු පැල අපනයනකරුවන් අතර සුළු පරිමාන අපනයනකරුවන්ගේ නියෝජනය (වසරකට ඇමරිකානු ඩොලර් 10,000 කට වඩා අඩු වටිනාකමකින් යුතු නිෂ්පාදන අපනයනය කරන්නන්) කැපී පෙනෙන අතර එය සමස්ථ අපනයනකරුවන්ගෙන් 66.5% ක ප්‍රතිශතයකි. පසුගිය දශකයක කාලසීමාව තුළ මහා පරිමාන අපනයනකරුවන්ගේ (වසරකට ඇමරිකානු ඩොලර් 100,000 කට වඩා වැඩි වටිනාකමකින් යුතු නිෂ්පාදන අපනයනය කරන්නන්) සහ සුළුපරිමාන අපනයනකරුවන්ගේ පැහැදිලි වර්ධනයක් නිරීක්ෂණය කළ හැකි වේ. වගු අංක 6 මඟින් වසර 2001 වන තෙක් මල් හා විසිතුරු පැල ආශ්‍රිත නිෂ්පාදන අපනයන ක්ෂේත්‍රය තුළ නියැලි සමාගම් හා ව්‍යවසායකයන් පිළිබඳ සංඛ්‍යා දත්ත ඉදිරිපත් කර තිබේ.

**වගුව 6**

**අපනයනකරුවන්ගේ වර්ධනය**

| පරිමානය \ වර්ෂය | 1992 | 1995 | 1998 | 2001 |
|---|---|---|---|---|
| සුළු පරිමාන අපනයනකරුවන් | 17 | 20 | 22 | 23 |
| මධ්‍ය පරිමාන අපනයනකරුවන් | 22 | 31 | 20 | 24 |
| මහා පරිමාන අපනයනකරුවන් | 77 | 67 | 67 | 93 |
| **එකතුව** | **116** | **118** | **109** | **140** |

**මූලාශ්‍රය - අපනයන සංවර්ධන මණ්ඩලය ශ්‍රී ලංකා රේගුව.**

මල් හා විසිතුරු පැල ආශ්‍රිත නිෂ්පාදන අපනයනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. 1980 දශකයේ සිටම ජාත්‍යාන්තර වෙළඳ ප්‍රදර්ශන සඳහා අපනයනකරුවන්ගේ නිෂ්පාදන ඉදිරිපත් කිරීමට අවශ්‍ය අවස්ථාව හා පහසුකම් සලසාදීම හරහා විදේශීය වෙළඳපොළ තුළ ප්‍රචාරණය සඳහා දායකවීම මෙන්ම ගැණුම්කරුවන් මුණගැසීම, ගිවිසුම් වලට එළඹීම, ඇණවුම් සඳහා ඉඩ ප්‍රස්ථා විවර කරදීම වැනි කාර්යයන්ගෙන් අපනයනකරුවන් වෙත මෙමඟින් විශාල සේවාවක් සැපයෙයි. එමෙන්ම, විදේශීය වෙළඳපොළ දත්ත හා තොරතුරු ලබාදීම, ගැණුම්කරුවන් පිළිබඳ තොරතුරු සැපයීම, අන්තර්ජාල පහසුකම් වැනි නව සන්නිවේදන තාක්ෂණ පහසුකම් නොමැති අපනයකරුවන් වෙත එම සේවාවන් ලබාදීම, අපනයනකරුවන් සඳහා මූල්‍ය පහසුකම් ලෙස ණය වැඩසටහන් හඳුන්වාදීම වැනි ක්‍රියාකාරකම් ද මෙමඟින් ඉටු කෙරේ.

**වගුව 7**

**මල් හා විසිතුරු පැල ආශ්‍රිත නිෂ්පාදන ආනයනය.**

| නිෂ්පාදන වර්ගය | 2000 | | 2001 | | 2002 | | 2003 | |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය ('000) | වටිනාකම (රු.මිලියන) | ප්‍රමාණය ('000) | වටිනාකම (රු.මිලියන) | ප්‍රමාණය ('000) | වටිනාකම (රු.මිලියන) | ප්‍රමාණය ('000) | වටිනාකම (රු.මිලියන) |
| රෝපන ද්‍රව්‍ය (බල්බ,කෝම, ආකන්ධ) (සංඛ්‍යාව) | 33.6 | 1.3 | 3.4 | 0.023 | 63.8 | 0.28 | 7.5 | 0.57 |
| ජීවී පැල හා දඬුකැබලි (සංඛ්‍යාව) | 4.9 | 4.9 | 73 | 6.2 | 26 | 1.7 | 136.5 | 4.1 |
| ජීවී පැල හා දඬුකැබලි (කි.ග්‍රෑ.) | 17.2 | 22 | 12.8 | 18.6 | 11.1 | 17.1 | 14.9 | 24.8 |
| කැපූ මල් (කි.ග්‍රෑ.) | 585.3 | 33.3 | 526.4 | 27 | 395.2 | 14.6 | 175.3 | 10.9 |
| කැපූ කොළ හා අතුරිකිලි (කි.ග්‍රෑ.) | 126.7 | 9.9 | 37.6 | 5.1 | 12.7 | 5.1 | 14.7 | 6.1 |
| එකතුව | | 71.4 | | 56.9 | | 38.78 | | 46.47 |

**මූලාශ්‍රය - ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය.**

විදේශීය වෙළඳපොළ වෙතින් ශ්‍රී ලංකාව වෙත ආනයනය කරනු ලබන මල් හා විසිතුරු පැල ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳව සැලකිලිමත්වීම ඉතා වැදගත් වේ. ඒ, අපනයනය හරහා විදේශ විනිමය ඉපැයීම මෙන්ම නිෂ්පාදන ආනයනය හේතුවෙන් විදේශයන් වෙත මුදල් ගලායාම කර්මාන්තයේ ස්ථාවරත්වය කෙරෙහි බලපෑම් ඇති කරනු ලබන නිසාවෙනි. විදේශයන් වෙතින් නව වර්ගයන් හි හා ප්‍රභේදයන් හි රෝපන ද්‍රව්‍ය ලබා ගැනීම කර්මාන්තයේ දියුණුව සඳහා අත්‍යාවශ්‍ය වේ. ආනයනය කරනු ලබන අවසාන නිෂ්පාදන (End Products) ප්‍රමාණය මගින් දේශීය වෙළඳපොළ තුළ ඉල්ලුම සැපිරීම සඳහා දේශීය නිෂ්පාදකයා කෙතරම් දුරට සමත්වී ඇති ද යන්න පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමේ හැකියාව ද පවතී. වගු අංක 07 මගින් වසර 2000-2003 කාල පරිච්ඡේදය තුළ ආනයනය කරනු ලැබූ මල් හා විසිතුරු පැල කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳ අගයයන් දක්වා තිබේ.

සලකා බලනු ලබන කාලසීමාව තුළ දී (වසර 2000 සිට 2002 දක්වා) කැපූ මල් හා විසිතුරු පැල ආශ්‍රිත නිෂ්පාදන ආනයන වියදම සාපේක්ෂව අඩු වී ඇති අතර නැවතත් 2003 වර්ෂයේ දී සුළු වැඩිවීමක් පෙන්නුම් කරයි. කැපූ මල් ආනයන ප්‍රමාණය ක්‍රමිකව පහළ බැස ඇති අතර ඒ හා සමගාමීව ආනයන වියදම ද අඩු වී තිබේ. කැපූ කොළ හා අතු - රිකිලි, කැපූ මල් හා එක්ව යමින් ආනයන ප්‍රමාණය හා ඒ සඳහා විදේශ විනිමය වැය කිරීම අතින් පැහැදිලි ලෙස අඩුවීමක් පවතී. මෙය එක්තරා ආකාරයකින් දේශීය නිෂ්පාදනය මගින් දේශීය වෙළඳපොළ අවශ්‍යතාවය සැලකිය යුතු අන්දමින් පූරණය කිරීමක් ලෙස සැලකිය හැකිය. අවසන් නිෂ්පාදන (End Products) ආනයනය සඳහා වැය කළ යුතු මුදල් ප්‍රමාණය ක්‍රමයෙන් අඩු වී ගොස් යෙදවුම් ලෙස බල්බ, කෝම, ආකන්ධ, ජීවී පැල, දඬු කැබලි හා වෙනත් රෝපන ද්‍රව්‍ය ආනයනය සඳහා වැය කරනු ලබන විනිමය ප්‍රමාණය වැඩිවීමක් නිරීක්ෂණය කිරීමට පුළුවන. මෙම තත්ත්වය කර්මාන්තයේ දියුණුව සඳහා අවශ්‍ය යෙදවුම් ආනයනය ඉහළ යාම නිසා හෝ විදේශීය වෙළඳපොළ තුළ මෙම වර්ගයන් හි මිල ඉහළ යාම නිසා හෝ සිදුවිය හැකිය.

## මල් හා විසිතුරු පැල කර්මාන්තයේ දේශීය වෙළඳපොළ

දේශීය මල් හා විසිතුරු පැල ආශ්‍රිත නිෂ්පාදන වෙළඳපොළ තුළ ශ්‍රී ලාංකික නිෂ්පාදන සඳහා වන වෙළඳපොළ කොටස (Market Share) කොපමණ ද යන්න පිළිබඳව පැහැදිලි හා නිරවද්‍ය දත්ත නොමැතිවීම කර්මාන්තයේ සංවර්ධනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග හා පියවරයන් සැලසුම්කරණයේ දී මෙන්ම ක්‍රියාවට නැංවීමේදී ගැටළුකාරී තත්ත්වයන් ඇති කිරීමට හේතුවකි. 1970 දශකය තුළ දී දේශීය මල් හා විසිතුරු පැල වෙළඳපොළ සංචාරක කර්මාන්තය ආශ්‍රිත වෙළඳපොළ හා මල් ශාලා ආශ්‍රිත වෙළඳපොළ ලෙස මෙම කර්මාන්තය සම්බන්ධයෙන් පැවති වෙළඳ පොළ අවස්ථා පැහැදිලිව හඳුනා ගත හැකි අයුරින් ප්‍රධාන අංශ දෙකකින් සමන්විතව පැවතිනි. සංචාරක කර්මාන්තය ආශ්‍රිත වෙළඳපොළ ප්‍රධාන වශයෙන්ම හෝටල් සඳහා අවශ්‍ය කැපූ මල්, කැපූ කොළ හා අතු රිකිලි සැපයූ අතර මල් ශාලා ආශ්‍රිත වෙළඳපොළ කොළඹ, මහනුවර ඇතුළු ප්‍රධාන නගර තුළ හා අවට මල්ශාලා වෙත මල් හා අතු - රිකිලි සැපයීම හා පදනම්ව ක්‍රියාත්මක වූවකි.

වර්තමානය වන විට, දේශීය වෙළඳපොළ ඉතා සංකීර්ණ හා විශාල වෙළඳ ප්‍රවාහයන් (Market Channels) සහිත වැඩි පාරිභෝගිකයින් සංඛ්‍යාවක් සිටින, එබැවින් වැඩි ඉල්ලුමක් ඇති වෙළඳපොළක් බවට පත්ව තිබේ.

දේශීය වෙළඳපොළ සඳහා සපයනු ලබන ඇන්තූරියම් හා ඕකිඩ් වැනි කැපූ මල් නිෂ්පාදනය පහත රට තෙත් කලාපය, (කොළඹ, කළුතර, ගම්පහ, ගාල්ල, මාතර) උඩරට හා මැදරට තෙත් කලාපය (කෑගල්ල, මහනුවර, නුවරඑළිය) සහ අතරමැදි කලාපය තුළ (බදුල්ල, කුරුණෑගල, පුත්තලම යන දිස්ත්‍රික්කයන්හි) බහුල ලෙස ව්‍යාප්තව පවතී. නව ද, සෞම්‍ය කලාපීය කැපූ මල් නිෂ්පාදන (රෝස, කානේෂන්, ඇස්ටර්, ක්‍රිසැන්තමම්, ලිලී, ඩේසි) ප්‍රධාන වශයෙන්ම නුවරඑළිය, බදුල්ල හා මහනුවර යන දිස්ත්‍රික්කයන්ට සීමාවී ඇති අතර ඒ සඳහා එම ප්‍රදේශයන් හි පවතින හිතකර දේශගුණික තත්ත්වයන් සෘජුවම බලපා තිබේ. විසිතුරු පැල නිෂ්පාදනය කෑගල්ල, ගම්පහ, මහනුවර, කුරුණෑගල, කළුතර, මාතලේ සහ කොළඹ යන දිස්ත්‍රික්කයන් හි ප්‍රධාන වශයෙන්ම කේන්ද්‍රගතව පවතී. මේ සඳහා යෙදවුම් ලබා ගැනීමේ පහසුව වෙළඳපොළ වෙත පහසුවෙන් ළඟාවීම, ප්‍රවාහන පහසුකම් පැවතීම යන කරුණු ප්‍රධාන වශයෙන්ම හේතු වී තිබේ.

දේශීය වෙළඳපොළ තුළ කැපූ මල් අලෙවිය නිෂ්පාදකයාගේ සිට හෝ එකතු කරන්නාගේ සිට කොළඹ, නුවර හා ප්‍රධාන නගර ආශ්‍රිත මල් ශාලා වෙත පොදු ප්‍රවාහන සේවාවන් (දුම්රිය, බස් රථ) හරහා සිදුවන අලෙවි ප්‍රවාහයන් ඔස්සේ සිදු වේ. එම ස්ථානවල සිට කෙලින්ම පාරිභෝගිකයින් වෙත සැපයුම සිදු වේ. හෝටල් හා මල් ශාලා වෙත කැපූ මල් සැපයුම බහුල වශයෙන්ම ගිවිසුම්ගත ක්‍රම යටතේ සිදුවන අතර සංචාරකයන් බහුලව පැමිණෙන කාල වකවානු තුළ දී, මෙම අලෙවි ප්‍රවාහය ඔස්සේ සිදුවන ගනු දෙනු ප්‍රමාණය සැලකිය යුතු මට්ටමකින් වැඩිවීමක් නිරීක්ෂණය කළ හැකිය. මංගල උත්සව අධිකව එළඹෙන මාර්තු, මැයි වැනි විශේෂ මාස වල දී කැපූ මල් සඳහා වන දේශීය ඉල්ලුම ඉතාමත් ඉහළ වන අතර නුවරඑළිය, බදුල්ල වැනි දිස්ත්‍රික්ක තුළ සිටින නිෂ්පාදකයින් හා එකතු කරන්නන් වෙතින් සෘජුවම පාරිභෝගිකයින්ට අවශ්‍ය නිෂ්පාදන ලබා ගැනීමේ අලෙවි ප්‍රවාහයක් ද මෙම කාලය තුළ දී නිරීක්ෂණය කළ හැකි වේ.

මල් පැල හා විසිතුරු පැල අලෙවිය මෙන්ම රෝපන ද්‍රව්‍ය අලෙවිය කැපූ මල් සඳහා භාවිතා කරනු ලබන අලෙවි ප්‍රවාහයන්ට වඩා වෙනස් වූ අලෙවි මාර්ග ඔස්සේ සිදුවන්නකි. විශේෂයෙන්ම, කොළඹ, ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්කයන් හි වගාකරුවන් තමන්ගේ නිෂ්පාදන සංවිධානගත මල් වගා

කරන්නන්ගේ සංගම් විසින් පවත්වනු ලබන ප්‍රදර්ශන හරහා පාරිභෝගිකයින් වෙතට ඉදිරිපත් කරනු ලබයි. එමෙන්ම, තම වගා ස්ථානයේදීම තොග හා සිල්ලර ලෙස තම නිෂ්පාදන අලෙවිය සිදු කිරීම ද සුලබ අලෙවි මාර්ගයකි. මල් හා විසිතුරු පැල එකතු කොට දේශීය වෙළඳපොළ වෙත ඉදිරිපත් කරන්නන් වෙත නිෂ්පාදන සැපයීම හා ජංගම අලෙවි රථ (ලොරි, වෑන්, බයිසිකල්) යොදා ගෙන අලෙවි කටයුතු සිදු කිරීම ද නිරීක්ෂණය කළ හැකි සැලකිය යුතු මට්ටමේ අලෙවි ක්‍රමයන් වේ. අපනයනකරුවන් වෙත අඛණ්ඩව නිෂ්පාදන සපයන වගා ක්‍රම (Out-grower Systems) බහුලව භාවිතා නොවුව ද එවැනි අලෙවි මාර්ග ඔස්සේ තම නිෂ්පාදන අලෙවි කරනු ලබන වගාකරුවන් ද මෙම ක්ෂේත්‍රය තුළ දැක ගත හැකිය.

අලෙවි ප්‍රවාහයක් ලෙස ආයතන තුළ හා ආයතන ආශ්‍රිතව අලංකරණය පිණිස මල් හා විසිතුරු පැල සැපයීම හා නඩත්තුව ජනප්‍රිය වෙමින් පවතී. පෙර ගිවිසුම් යටතේ ක්‍රියාත්මක වන මෙම අලෙවි ප්‍රවාහය ප්‍රධාන වශයෙන්ම ප්‍රධාන නගරාශ්‍රිත රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සහ හෝටල් ආශ්‍රිතව ප්‍රචලිත වූවකි.

උද්‍යානකරණය ද ප්‍රධාන මල් හා විසිතුරු පැල අලෙවි ප්‍රවාහයක් ලෙස වැදගත් ස්ථානයක් හිමි කර ගෙන සිටී. මෙවැනි අලෙවි ප්‍රවාහයන් සමඟ සපයනු ලබන සේවාව වෙනුවෙන් ද අය කිරීමක් සිදුවන නිසා මෙම ක්‍රම වඩාත් ජනප්‍රිය වෙමින් පවතී. 2004 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවට අනුව, හෝටල් සහ නිවාස සංකීර්ණ හා එවැනි වෙනත් ස්ථානයන් හි අලංකරණය සඳහා ඉල්ලුම ඉහළ යාම, සමාජීය උත්සව සඳහා මල් සැරසිලි භාවිතය ඉහළ යාම සහ කුඩා පරිමාණ ව්‍යවසායකයන්ගේ මල් හා විසිතුරු පැල ප්‍රදර්ශන පැවැත්වීම, වඩාත් ජනප්‍රිය වීම තුළින් මෙම කර්මාන්තය දේශීය වෙළඳපොළ තුළ සීඝ්‍රයෙන් පුළුල් වන බව නිරීක්ෂණය කළ හැකි බව ද සඳහන් කළ යුතු වේ.

කෙසේ වෙතත්, දේශීය වෙළඳපොළ තුළ සංසරණය වන කැපූ මල් හා විසිතුරු පැල හා ආශ්‍රිත නිෂ්පාදන ප්‍රමාණය හා ඒවායේ වටිනාකම පිළිබඳව නිරවද්‍ය දත්ත නොමැතිවීම කර්මාන්තයේ සංවර්ධනය සඳහා අවශ්‍ය ඉදිරි පියවරයන් ක්‍රියාත්මක කිරීම සඳහා බාධාවක්ව පවතී.

## මල් හා විසිතුරු පැල කර්මාන්තය ආශ්‍රිත ගැටළු හා සීමා

ඉහත දී සඳහන් කළ ආකාරයට මෙම කර්මාන්තය තුළ දේශීය වෙළඳපොළ ඉලක්ක කොට ගත් සුළු හා මධ්‍ය පරිමාන වගාකරුවන් හා ඒ ආශ්‍රිත එකතු කරන්නන් ලෙස සහ අපනයනාභිමුඛ මහා පරිමාන වගාකරුවන් වශයෙන් ප්‍රධාන කණ්ඩායම් දෙකක් පැහැදිලිව හඳුනා ගත හැකිය. එම කණ්ඩායම් මුහුණ දෙන ප්‍රශ්න, ගැටළු හා සීමාවන් එකිනෙකට වෙනස් ස්වරූපයක් ගනු ලබයි. ක්ෂේත්‍රය තුළ තාක්ෂණික වශයෙන් පවතින ගැටළු, යෙදවුම් ආශ්‍රිත ගැටළු, අලෙවිකරණය සමඟ සංවිධාන හා බැඳුණු ගැටළු, මූල්‍ය සීමාවන් හා වගා කිරීම සඳහා අවශ්‍ය ඉඩම් පිළිබඳ ගැටළු ආදිය ප්‍රධාන වශයෙන්ම සුළු හා මධ්‍ය පරිමාන වගාකරුවන්ට මුහුණ දීමට සිදුවී ඇති තත්ත්වයන්ය. විදේශීය වෙළඳපොළ වෙත නිෂ්පාදන ඉදිරිපත් කරනු ලබන මහා පරිමාන වගාකරුවන් හා අපනයනකරුවන් මුහුණ දෙනු ලබන ගැටළු මෙයට වඩා වෙනස් ස්වරූපයක් ගනු ලබයි. පසුගිය දශක තුනකට වඩා වැඩි කාලයක් තුළ අතීතය පිළිබඳව සලකා බැලීමේ දී, බොහෝ දුරට එකම ආකාරයේ ගැටළු සමුදායකට කර්මාන්තය මුහුණ දී ඇති බව නිරීක්ෂණය කළ හැකිය.

1970 අග භාගයේ දී සමුපකාර කළමනාකරණ සේවා මධ්‍යස්ථානය, වැව්ලි සංවර්ධන අමාත්‍යාංශය සහ කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය මඟින් සිදු කර ඇති අධ්‍යයනයන්ට අනුව දේශීය වෙළඳපොළ වෙත නිෂ්පාදනය කරනු ලබන වගාකරුවන් මුහුණපාන ගැටළු හා ඒවාට නිර්දේශ කොට ඇති විසඳුම් වර්තමානය වන විට කර්මාන්තය මුහුණ පා සිටින ගැටළු හා ඒ ආශ්‍රිත විසඳුම් සමඟ සමපාත බවක් පෙන්නුම් කරනු ලබයි. එමෙන්ම, 1994 කෘෂිකර්ම, ඉඩම් හා වන සම්පත් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද ජාතික ප්‍රතිපත්ති සැලසුම් වාර්තාව හා 1997 කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය මඟින් එළිදක්වන ලද සමීක්ෂණ වාර්තාවක් මඟින් ද ක්ෂේත්‍රය මුහුණ පා සිටින ගැටළු හා සීමාවන් පැහැදිලි ලෙස දක්වා තිබේ. එම වාර්තාවන්ට අනුව, පහත ගැටළු කර්මාන්තය තුළ පැහැදිලිව හඳුනා ගත හැකිය.

### i. නව වර්ගයන් හි හා නව වගා ප්‍රභේදයන් හි බීජ හා රෝපන ද්‍රව්‍ය නොමැතිවීම හා ලබා ගැනීමට අපහසුවීම

ප්‍රධාන වශයෙන්ම නව ප්‍රභේද බිහි කිරීම පිළිබඳව පර්යේෂණ පවත්වනු ලබන රාජ්‍ය ආයතන ලෙස රාජකීය උද්භිද උද්‍යානය හා බණ්ඩාරවෙල කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය ඇතුළු ආයතන කිහිපයක් කටයුතු කරනු ලබයි.මෙහි දී,පොදුවේ රාජ්‍ය ආයතනයන් හි පවතින ප්‍රායෝගික සීමාවන් හමුවේ එවැනි ආයතන කිහිපයකට පමණක් මේ සම්බන්ධව කටයුතු කරමින් සෑම දේශීය නිෂ්පාදකයෙකු සඳහාම රෝපන ද්‍රව්‍ය සැපයීමේ හැකියාවක් නොපවතී. බොහෝ විට නව ප්‍රභේද වර්ග විදේශයන්ගෙන් ආනයනය කරනු ලබන අතර එම කාර්යාවලීන්හි දී පැළෑටි නිරෝධායනය සඳහා ලක් කළ යුතුය. එම අංශයන් හි කාර්යක්ෂමතාවය එමනිසා කර්මාන්තයේ සංවර්ධනයට ඉතා වැදගත් වේ. තව ද, දැනට දේශීය වශයෙන් පවත්වා ගෙන යනු ලබන ප්‍රභේද වැඩිදියුණු කිරීමේ හා බෙදා හැරීමේ කටයුතු කාර්යක්ෂම කළ යුතු වේ.

### ii. වගාව සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ මිල අධික වීම.

විශේෂයෙන්ම, වගා මාධ්‍ය සඳහා අවශ්‍ය කොහු බත්, ගොම වැනි ද්‍රව්‍ය, පෝච්චි හා පොලිතීන් බඳුන් මෙන්ම පොලිතීන්, කෘෂි රසායන හා රසායනික පොහොර වර්ග ආදියෙහි අධික මිල, අවසාන නිෂ්පාදනයෙහි නිෂ්පාදන පිරිවැය ඉහළ යාමට හේතුවකි. ගොම, කොහුබත් ආදිය සපයා ගැනීමේ අපහසුව හා නිෂ්පාදන ප්‍රදේශයන් හි සිට වගා බිම් වෙත (විශේෂයෙන්ම කොළඹ හා ප්‍රධාන නගර ආශ්‍රිත) ප්‍රවාහනය කිරීම සඳහා වැඩි පිරිවැයක් දැරීමට සිදුවීම ද මෙම ක්ෂේත්‍රය තුළ මතුව ඇති ප්‍රධාන ගැටළුවකි.

### iii. වගා වපසරිය වැඩි කිරීම සඳහා අවශ්‍ය ඉඩම් නොමැතිවීම.

විශේෂයෙන්ම කොළඹ, කළුතර, ගම්පහ වැනි ප්‍රධාන නගර හා අවට ප්‍රදේශයන් හි විසිරී සිටින (නාගරික හා අර්ධ නාගරික) වගාකරුවන්හට මෙම ගැටළුව ප්‍රධාන වශයෙන්ම බලපා තිබේ. ජල පහසුකම් හා ප්‍රවේශ වීමේ හැකියාව ඇති (වාහන ගමන් කළ හැකි මාර්ග සහිත) නගරයන්ට ආසන්නව තිබෙන ඉඩම් සීමා සහිතවීම කර්මාන්තයේ සංවර්ධනය සඳහා බාධාවක්ව පවතී.

### iv. නව වගා ක්‍රම හා තාක්ෂණික දැනුම ලබා ගැනීමේ අපහසුතාවය සහ සේවාවන් නොමැතිවීම.

මෙම ක්ෂේත්‍රය නිරන්තරයෙන්ම නව වගා ප්‍රභේද බිහි වන හා ඒවාට අවශ්‍ය නව වගා ක්‍රම හා තාක්ෂණික දැනුම වැඩිදියුණු වන ක්ෂේත්‍රයකි. එම වගා ප්‍රභේද හා ඒවාට අදාල වගා ක්‍රම අනුගමනය කිරීම තුළින් වඩාත් ආකර්ශනීය නිෂ්පාදනයක් පාරිභෝගිකයා වෙත ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම ක්ෂේත්‍රය තුළ තවදුරටත් රැඳී සිටීම පිළිබඳව ප්‍රශ්න ඇති කරනු ලබයි. එබැවින්, නව දැනුම හා තාක්ෂණය පිළිබඳව දැනුවත් වීමේ ක්‍රමවේදයක් තිබීම අත්‍යාවශ්‍ය වේ. එසේ වුව ද, රාජ්‍ය අංශයේ කෘෂිකර්ම ව්‍යාප්ත සේවාවන් මඟින් ලැබෙන සේවය මෙම ක්ෂේත්‍රය තුළ වගාකරුවන් බලාපොරොත්තු වන මට්ටමට ළඟා වී නොමැති අතර ඇතැම් අවස්ථාවන් හි එවැනි සේවාවක් ලබා ගැනීමේ නොහැකියාවක් ද පවතී. විශේෂයෙන්ම රෝපන ක්‍රම, ලබා දිය යුතු පරිසර තත්ත්ව, රෝග හා පලිබෝධ පාලනය වැනි සූක්ෂම අවස්ථා සඳහා ලැබිය යුතු තාක්ෂණික දැනුම නොලැබීම කර්මාන්තයේ ඉදිරි දියුණුවට බාධාවක්ව පවතී.

### v. අලෙවිකරණය පිළිබඳ ගැටළු

ඉහත පරිච්ඡේදයක සඳහන් කළ ආකාරයට දේශීය වෙළඳපොළ අලෙවි මාර්ග රාශියකින් යුක්ත වේ. එම සෑම අලෙවි මාර්ගයකටම අවතීර්ණ වීමේ හැකියාව සෑම වගාකරුවෙකුම සතු නොවූවකි. බොහෝ විට වඩාත් ජනප්‍රිය අලෙවි මාර්ගයක් වන මල් ප්‍රදර්ශන හා අලෙවි සැල් වෙත පැමිණ අලෙවි කිරීමේ හැකියාව කුඩා පරිමාන නිෂ්පාදකයින් සතු නොවේ. වෙළඳකුටි සඳහා දැරිය යුතු පිරිවැය වැඩිවීම සහ ප්‍රවාහන වියදම් ආදී ගැටළු මේ සඳහා හේතු වී තිබේ. විශේෂයෙන්ම, ග්‍රාමීය හා අර්ධ නාගරික ප්‍රදේශයන්හි වගාකරුවෝ අලෙවිය සම්බන්ධ ගැටළු වලට දැඩිව මුහුණ පා සිටිති.

### vi. මූල්‍ය පහසුකම් ලබා ගැනීමට ඇති බාධා

විශේෂයෙන්ම වගාව වැඩිදියුණු කිරීම සඳහා මෙන්ම අවශ්‍ය උපකරණ හා ද්‍රව්‍ය ලබා ගැනීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා ගැනීමේ ඇති අපහසුකම් කුඩා හා මධ්‍ය පරිමාණ වගාකරුවන් ගේ ප්‍රධාන ගැටළුවක් බවට පත්ව තිබේ. බැංකු හරහා ණය ලබා ගැනීමට ඇති සීමාවන් හා පවතින අධික පොලී අනුපාතයන් මෙම තත්ත්වයන්ට හේතු වශයෙන් සඳහන් කළ හැකිය. දෙවන බහුවාර්ෂික බෝග වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන කෘෂි "අරුණ" ණය වැඩසටහන මඟින් මල් හා විසිතුරු පැල වගාව සඳහා ණය නිකුත් කරනු ලබයි. එමෙන්ම, පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය හා සමෘද්ධි සංවර්ධන වැඩසටහන යටතේ ද, මෙවැනි ණය හා ආධාර වැඩසටහන් ක්‍රියාත්මක වේ. මෙවැනි මූල්‍ය පහසුකම් ලබාදීමේ මූලාශ්‍ර පිළිබඳව වගාකරුවන් දැනුවත් කිරීම හා ඒ සඳහා යොමු කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් අවශ්‍යය.

### vii. කර්මාන්තය සම්බන්ධ තොරතුරු සන්නිවේදනය වීමේ දුර්වලතා

විශේෂයෙන්ම මල් ප්‍රදර්ශන, පවතින ණය වැඩසටහන්, පුහුණු වැඩසටහන් සහ පුහුණු පාඨමාලා පිළිබඳ විස්තර, එසේම නව ප්‍රභේද හා නව වගා ක්‍රම ආදිය පිළිබඳව තොරතුරු හුවමාරුවීමේ ක්‍රමවත් යාන්ත්‍රණයක් නොමැති වීම ද, සුළු පරිමාන වගාකරුවන් අධෛර්යමත් වීමට හේතුවී තිබේ. තව ද, ජනමාධ්‍ය තුළ මෙම විෂය පථය පිළිබඳව ලබාදී ඇති ඉඩ ප්‍රස්ථාව පුළුල් කිරීම, මේ සඳහා යම් පිටුබලයක් සපයනු ඇතැයි අපේක්ෂා කළ හැකිය.

විදේශීය වෙළඳපොළ ඉලක්ක කොට ගත් මල් හා විසිතුරු පැල අපනයනකරුවන් හා මහා පරිමාන වගාකරුවන් මුහුණ දෙන ඇතැම් ගැටළු, සුළු හා මධ්‍ය පරිමාන වගාකරුවන්ගේ ගැටළු හා සීමාවන් සමඟ සමාහාම් වුව ද, ඔවුන් සඳහාම සුවිශේෂ වූ ගැටළු සමුදායන් ක්ෂේත්‍රය තුළ පවතී.

- **වගා කටයුතු ව්‍යාප්ත කිරීම සඳහා සුදුසු ඉඩම් ලබා ගැනීමේ අපහසුතාව.**

මෙම තත්ත්වය කුඩා හා මධ්‍ය පරිමාන වගාකරුවන්ට ද බලපානු ලබන ප්‍රධාන ගැටළුවකි. කර්මාන්තයේ වාර්ෂික වර්ධන වේගය 10% ලෙස සැලකීමේ දී වාර්ෂිකව අවශ්‍ය වන නව බිම් ප්‍රමාණය සෑම වසරක් තුළම ඉහළ යන බව 2004 වර්ෂයේ දී එළි දක්වන ලද පර්යේෂණ වාර්තාවක් මඟින් පෙන්වා දී තිබේ. එම වර්ධන සීඝ්‍රතාවය යටතේ වසර 2003 දී වසරකට අවශ්‍ය නව භූමි ප්‍රමාණය හෙක්ටයාර් 234 ක් වූ අතර වසර 2012 දී එය හෙක්ටයාර් 502 ක් ලෙස ඇස්තමේන්තු කොට ඇත. මෙම අභියෝගය ජය ගැනීම මේ වන විට ද විශාල ගැටළුවක් බවට පත්ව තිබේ.

- **ආනයනිත රෝපන ද්‍රව්‍ය සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවීම.**

නව ප්‍රභේද හා වගා දර්ශ උත්පාදනය හා සංවර්ධනය කිරීම අරමුණු කොට ගත් ජාතික මට්ටමේ වැඩපිළිවෙලක් වඩා සක්‍රියව ක්‍රියාත්මක නොවන නිසා බොහෝ නව වගා දර්ශයන්හි රෝපන ද්‍රව්‍ය ආනයනය කරනු ලබන අතර ඒ සඳහා දැරිය යුතු පිරිවැය ඉතාමත් ඉහළ අගයක් ගැනීම විශාල පරිමාන වගාකරුවන්හට ද විශාල ගැටළුවක් බවට පත්ව ඇති බව වාර්තා වේ. එමෙන්ම, වෙළඳපොළ වෙත අළුතින් එකතු වන විදේශීය ශාක ප්‍රභේදයන් හි රෝපන ද්‍රව්‍ය හෝ මව් ශාක ආනයනය කිරීම අත්‍යාවශ්‍ය වන අතර ඒ සඳහා ද දැරිය යුතු පිරිවැය ඉතා අධිකය. එබැවින්, රෝපන ද්‍රව්‍ය ආනයනයේ දී ලිහිල් ප්‍රතිපත්ති (බදු ගාස්තු අය කිරීම) අනුගමනය කිරීම කර්මාන්තයේ දියුණුවට යම් අස්වැසිල්ලක් වනු නොඅනුමානය. එවැනි ලිහිල් ආනයන ප්‍රතිපත්ති හරහා රට තුළට ඇතුළු විය හැකි ආක්‍රමණික ශාක, රෝග කාරක හා පළිබෝධ පාලනය සඳහා විධිමත් නිරෝධායන සේවාවක් පවත්වා ගෙන යාම ද අත්‍යාවශ්‍ය වේ.

- **වගාව ආශ්‍රිත ද්‍රව්‍ය හා උපකරණ මිල ඉතා අධිකවීම.**

විශේෂයෙන්ම හරිතාගාර, පොලිතීන් ගෘහ ආදී ආරක්ෂිත ගෘහ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සහ ඒවායේ ඇතුළත වගාව ස්ථාපනය සඳහා අවශ්‍ය මෙවලම් හා උපකාරක ද්‍රව්‍ය ලෙස වගා මාධ්‍ය, පොහොර හා කෘෂි රසායන, සිසිල්කරන උපකරණ, ක්ෂුද්‍ර ජල සම්පාදන උපකරණ ආදී මෙවලම් හා ද්‍රව්‍යයන් හි මිල ඉතාමත් වැඩිවීම, ආරක්ෂිත තත්ත්වයන් යටතේ වඩා උසස් ගුණාත්මයෙන් යුතු නිෂ්පාදන සඳහා වගාකරුවන් පෙළඹීමට බාධාවක්ව පවතී. එමෙන්ම, මෙම තත්ත්වය නිෂ්පාදන පිරිවැය වැඩි වීමට ද හේතුවකි.

- **මූල්‍ය පහසුකම් සපයා ගැනීමේ ගැටළු**

බැංකු ණය සහ වෙනත් ව්‍යාපෘති හා වැඩසටහන් යටතේ ණය ආධාර ලබා ගැනීමේ අපහසුව සහ ඒ සඳහා වන පොලී අනුපාතය වැඩිවීම මෙම තත්ත්වයට බෙහෙවින්ම බලපා තිබේ. මෙම කර්මාන්තය ප්‍රාග්ධන සූක්ෂම වගා ක්‍රමයක් බව, වෙනත් බෝග වගාවන්ට සාපේක්ෂව සැලකු කල පෙනී යන කාරණයකි. ඒ අනුව, ක්ෂේත්‍රයේ වර්ධනයත් සමඟ අවශ්‍ය වන වාර්ෂික ප්‍රාග්ධන ප්‍රමාණය 2003 වසර සඳහා වසරකට රුපියල් මිලියන 1100 සිට වසර 2012 වන විට වසරකට රුපියල් මිලියන 2593.3 දක්වා වර්ධනය වන බව පර්යේෂණ වාර්තා මඟින් පෙන්වා දී තිබේ. එබැවින්, වගාකරුවන්ගේ ප්‍රාග්ධන අවශ්‍යතා සැපිරීම සඳහා වන විධිමත් වැඩපිළිවෙලක අවශ්‍යතාවය ඉතාමත් දැඩිව පවතී.

- **ඉහළ ගුවන් බහාලුම් ගාස්තු අය කිරීම.**

මල් හා විසිතුරු පැල ආශ්‍රිත නිෂ්පාදන ජීවී ද්‍රව්‍ය වන බැවින් ඉක්මණින් එහි තත්ත්වය හා ගුණය පහළ වැටී නරක්වීම් වලට ලක් වේ. එබැවින්, හැකි ඉක්මණින් ගමනාන්තයන් වෙත යැවීම සිදු කළ යුතු අතර මේ සඳහා බොහෝ විට ගුවන් ප්‍රවාහන සේවා උපයෝගී කර ගනී. මේ හේතුව නිසාම දැරිය යුතු පිරිවැය ඉතා අධිකය. මෙම තත්ත්වය, මෙම කර්මාන්තය ආරම්භක අවධියේ සිටම පැවති ගැටළුවක් ව ඇති අතර 1970 දශකය තුළ ද මෙම ගැටළුව ඉතා දැඩිව කර්මාන්තය වෙත බලපෑම් සිදු කොට තිබුණි.

- **ගුවන්ගත කිරීමට පෙර අවශ්‍ය ශීතාගාර සහිත ගබඩා පහසුකම් ප්‍රමාණවත් නොවීම.**

කටුනායක ජාත්‍යාන්තර ගුවන් තොටුපොළ ආශ්‍රිතව පවතින ශීතාගාර සහිත ගබඩා ප්‍රමාණය, විදේශ වෙළඳපොළ සඳහා ඉදිරිපත් කරනු ලබන ඉක්මණින් ගුණාත්මය වියැකෙන මල් හා විසිතුරු පැල ආශ්‍රිත නිෂ්පාදන ප්‍රමාණය ගබඩා කිරීමට ප්‍රමාණවත් නොවීම මෙම ක්ෂේත්‍රයේ ප්‍රධාන ගැටළුවකි. මෙය මල් හා විසිතුරු පැල නිෂ්පාදන අපනයනකරුවන්ගේ සංගමය විසින් නිරන්තරයෙන්ම පෙන්වා දෙනු ලබන්නකි.

- **කර්මාන්තයේ සංවර්ධනය සඳහා අවශ්‍ය තාක්ෂණික සංවර්ධනය, අධ්‍යාපනය හා පුහුණුකිරීම් සම්බන්ධයෙන් අවශ්‍ය යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම.**

නව තාක්ෂණික දැනුම උත්පාදනය කිරීම, එම දැනුම වගාකරුවන් අතර ප්‍රචලිත කිරීම හා පවතින දැනුම සංවර්ධනය කිරීම වැනි කටයුතු සඳහා පවතින පහසුකම් මෙන්ම ක්‍රියාත්මක

වන වැඩපිළිවෙල ප්‍රමාණවත් නොවීම මහ පරිමාන නිෂ්පාදකයන්ට ගැටළුවකි. එමනිසා, එම නිෂ්පාදකයන්ට අවශ්‍ය දැනුම හා තාක්ෂණය මුදල් ගෙවා ලබා ගැනීමට සිදුවීම, තම ආයතන තුළ පර්යේෂණාගාර පවත්වා ගෙන යාම හා පුහුණු සේවකයින් යෙදවීම වැනි කටයුතු නිසා ද විශාල පිරිවැයක් දැරීමට සිදු වේ. මෙම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වගකිව යුතු නිශ්චිත ආයතනයක් ස්ථාපනය වී නොතිබීම මෙයට හේතුවක් විය හැකිය. වසර 20 කට පමණ පෙරදී පවා (1984) විද්‍යා ප්‍රතිපත්ති වාර්තාව මඟින් මල් හා විසිතුරු පැල ආශ්‍රිත ලේකම් කාර්යාලයක් (Floriculture Secretariat) පිහිටුවීම සඳහා නිර්දේශයක් පැවතිය ද තවමත් එම කාර්යයන් ඉටු වී නොමැත.

මෙම ප්‍රධාන ගැටළු වලට අමතරව අපනයනය සඳහා දිගු කාර්යාවලියක් (රාජ්‍ය ආයතන හරහා සිදුවන) තුළ ප්‍රමාදයන්ට ලක්වීම, වඩාත් සුදුසු ඇසුරුම් ක්‍රම භාවිතය ඉතා වියදම් අධික වීම, නිරවද්‍ය දත්ත හා තොරතුරු ලබා ගත හැකි මූලාශ්‍රයක් නොමැතිවීම වැනි ගැටළු සඳහා මුහුණ පෑමට අපනයන වෙළඳපොළ තුළ නියුතු වගාකරුවන්ට සිදුවී තිබේ.

වගුව 8

## දළ දේශීය නිෂ්පාදිතය වෙත මල් හා විසිතුරු පැල අංශයේ දායකත්වය

| වර්ෂය | විදේශ විනිමය ප්‍රමාණය (රු. මිලියන) | දළ දේශීය නිෂ්පාදනයෙහි දායකත්වය % | දළ දේශීය නිෂ්පාදනය වෙත කෘෂිකාර්මික අංශයේ දායකත්වය % |
|---|---|---|---|
| 1992 | 282.2 | 0.07 | 21.3 |
| 1993 | 287.4 | 0.06 | 20.9 |
| 1994 | 406.8 | 0.08 | 20.5 |
| 1995 | 430.1 | 0.07 | 20.0 |
| 1996 | 454.2 | 0.06 | 18.4 |
| 1997 | 484.8 | 0.06 | 17.8 |
| 1998 | 496.9 | 0.05 | 21.1 |
| 1999 | 572.9 | 0.06 | 21.3 |
| 2000 | 626.6 | 0.05 | 19.9 |
| 2001 | 723.1 | 0.06 | 20.1 |
| 2002 | 776.0 | 0.05 | 20.1 |
| 2003 | 924.8 | 0.06 | 19.0 |
| 2004 | 915.0 | 0.05 | 17.9 |

**මූලාශ්‍රය - ශ්‍රී ලංකා අපනයන සංවර්ධනය මණ්ඩලය**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

මල් හා විසිතුරු පැල කර්මාන්තයේ සංවර්ධනය හා ආර්ථිකමය වටිනාකම විවිධ වකවානු තුළ දී ඉතාමත් දැඩිව පෙන්වා දෙනු ලැබ ඇති අතර විදේශ විනිමය ඉපැයීමේ ඉතා පැහැදිලි අංශයක් ලෙස හා නව රැකියා අවස්ථා උත්පාදනය කිරීමේ මාර්ගයක් ලෙස මෙම කර්මාන්තයේ වැදගත්කම ඉතා පැහැදිලිය. පසුගිය වසර 15 ක පමණ කාලය තුළ කර්මාන්තය හරහා උපයන ලද විදේශ විනිමය ප්‍රමාණය ඉතාමත් ඉහළ ප්‍රතිශතය (1992 සිට 2004 දක්වා කාලය තුළ උපයන ලද විදේශ විනිමය ප්‍රමාණය 224.5% වැනි ඉහළ ප්‍රතිශතයකින් වර්ධනය වී ඇත) කි. එමෙන්ම, දළ දේශීය නිෂ්පාදිතය තුළ කෘෂිකාර්මික අංශය මඟින් දක්වනු ලබන දායකත්වය දිගින් දිගටම අඩු වන තත්ත්වයක් තුළ මල් හා විසිතුරු පැල කර්මාන්තය මඟින් දළ දේශීය නිෂ්පාදිතය තුළ අත්පත් කර ගෙන සිටිනු ලබන කොටස ස්ථාවරව පවත්වා ගැනීමට හැකිවීම කර්මාන්තයේ සාපේක්ෂ වර්ධනයක් බව සඳහන් කළ හැකිය.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ වාර්තාවකට අනුව 2001 වන විට මෙම කර්මාන්තය නිසා උත්පාදනය වී ඇති සෘජු රැකියා අවස්ථා ප්‍රමාණය 3000 ලෙස ඇස්තමේන්තු කොට තිබේ. මෙම රැකියා අවස්ථා විශේෂයෙන්ම අර්ධ නාගරික හා ග්‍රාමීය අංශය තුළ ව්‍යාප්තව පවතී. මෙම කර්මාන්තයේ පවතින ආකර්ශනීයභාවය සාම්ප්‍රදායික බෝග නිෂ්පාදනයට වඩා වැඩි නිසා විශේෂයෙන්ම රැකියා විරහිත තරුණ පරම්පරාවේ සාමාජිකයින් කර්මාන්තය වෙත උරා ගැනීමේ හැකියාවක් පෙන්නුම් කරයි. එමෙන්ම, මල් හා විසිතුරු පැල කර්මාන්තය වෙත ශ්‍රමය අවශෝෂණය කර ගැනීමේ හැකියාව සාම්ප්‍රදායික කෘෂිකාර්මික කටයුතු වලට වඩා ඉහළ අගයක් ගනී. කෘෂිකර්ම අමාත්‍යාංශ වාර්තාවකට අනුව මල් හා විසිතුරු පැල කර්මාන්තය සිදු කරනු ලබන ඒකක බිමක් (හෙක්ටයාර් 1 ක්) සඳහා අවශ්‍ය ශ්‍රමිකයින් සංඛ්‍යාව 10-15 වන අතර සාම්ප්‍රදායික බෝග නිෂ්පාදන බිමකට (හෙක්ටයාර් 1 ක් තුළ) අවශෝෂණය කර ගනු ලබන ශ්‍රමිකයින් ප්‍රමාණය 2-3 දක්වා වන ඉතා අඩු සංඛ්‍යාවකි. මේ අනුව මල් හා විසිතුරු පැල කර්මාන්තය දියුණු කිරීම හරහා වැඩි රැකියා අවස්ථා ප්‍රමාණයක් ජනනය කිරීමට ඇති ශක්‍යතාවය ඉතාමත් ඉහළ මට්ටමක පවතී.

ශ්‍රී ලංකාව එකිනෙකට වෙනස් කෘෂි දේශගුණික කලාප 23 කින් යුක්ත වීමත්, ඒ ඒ දේශගුණික කලාප තුළ පවතින එකිනෙකට වෙනස් පාංශු හා දේශගුණික ලක්ෂණ ඝර්ම කලාපීය හා සෞම්‍ය කලාපීය මල් හා විසිතුරු පැල වගා විශේෂයන්ගේ වර්ධනයට හිතකර වීමත් කර්මාන්තයේ වර්ධනය සඳහා පවතින තවත් සුභවාදී තත්ත්වයක් බව අවසාන වශයෙන් සනිටුහන් කළ හැකිය.

### දැනුම

**කිසියම් අයෙකුට තමන්ගේම දැනුම හැරුණු විට අන් අයෙකුගේ දැනීමක් ගෝචර නොවන්නේ ය. තම දැනුම් රටාවෙන් උපදින ක්‍රියාදාමයන් තුලින් මිනිසාට තෘප්තිමත් විය හැකිය.**

*- තෝමස් කූපර් -*